

# සිනුවර හසුන

## සිඩ්නි සිට ලියමි

රූපවාහිනී යනු "ටෙලිවිෂන්" යන ඉංගිරිසි වදනේ අරුත දෙන සිංහල වදනයි. ලංකාවේ ටෙලිවිෂන් විකාශන ආරම්භයට පෙර මේ සඳහා "තලදසුන" වැනි වදනක් සරච්චන්ද්‍ර වැනි වියතෙකු විසින් යොදා ගෙන තිබුණු බව මගේ මතකයයි. ඉන්දියාවේ රාජ්‍ය අංශයේ ටෙලිවිෂන් සේවාව හැඳින්වෙන්නේ "දූරදර්ශන්" නමින් බව සලකන විට "දුරදසුන" යන වදන රූපවාහිනී යන්නට වැඩියෙන් අර්ථාන්විත බව පෙනේ. ඇත්තටම රූපවාහිනිය යන වදන ගෙන දෙන්නේ පික්චර් ට්‍රාන්ස්මිෂන් (Picture Transmission) යන අරුතයි.

අද ලංකාවේ රූපවාහිනී යන වදනින් පොදුවේ සියළුම ටෙලිවිෂන් සේවාවන් ද, රජයෙන් පාලනය වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවද, එමගින් කරන ප්‍රධාන විකාශනය ද යන සියල්ලම හැඳින්වුන ද ඓතිහාසික හේතු නිසාවෙන් දෝ එම වදන කණ වැටෙන විට අපේ සිතට මුලින්ම නැගෙන්නේ රජයේ ටෙලිවිෂන් චැනලයයි.

ලංකාවේ මුලින්ම රූපවාහිනී සේවාවක් ලෙස පටන් ගන්නා ලද්දේ ස්වාධීන රූපවාහිනියයි. ටික කලකට පසුව එය රජයට පවරා ගන්නා ලද අතර, ඉන් පසු රජයෙන් ද රූපවාහිනී සංස්ථාව පිහිටුවා වැඩසටහන් විකාශනය ආරම්භ කරන ලදී. එද අපි ටියුෂන් පන්ති අවසන් වී නිවෙස් බලා යන අතරතුර බම්බලපිටියේ සාප්පුවල වීදුරු තුලින් ඒ අපූරු රූපවාහිනී දර්ශන බලමින් සතුටු වූ අයුරු තවමත් මගේ මතකයේ ඇත.

නගරබදව නම් දෙරින් දෙර ඇන්ටෙනා රැඳවූ උණ බට සිට වෙන්නට පටන් ගත් නමුදු, ආර්ථික ප්‍රශ්ණ, විදුලි බලය නොමැතිකම යනාදී හේතු නිසා, රූපවාහිනීය ගමට ගියේ නම් ඉතා මන්දගාමී වේගයකිනි. තමන් සතු රූපවාහිනී යන්ත්‍රයක් තිබුනද, එය නැරඹීමට නම් වසරකට රුපියක් 250 ක් වැනි විශාල මුදලක් ගෙවා බලපත්‍රයක් ද ලබාගත යුතු විය. මෙය විශාල මුදලක් වන්නේ ඒ සමයේ, එනම් 1980 ජූලි යේ පැවති, හතලිස් දහසක පිරිසකට රැකියා අහිමිවුණු, මහා වැඩ වර්ජනයේ ප්‍රධාන ඉල්ලීම වූයේ දිනකට රුපියල් දහයකින් පඩි වැඩි කිරීම බව සලකා බලන කලය. පොදු ජන ආහාරය වූ පාන් ගෙඩියක මිල ද මේ දිනවල රුපියල් තුනයි ශත පහක් පමණක් විය.

රසික ජනතාව රූපවාහිනිය නැරඹීමට පෙළඹීම නිසා, වෙනත් විනෝදාත්මක කලා මාධ්‍යයන්, විශේෂයෙන් චිත්‍රපට සහ වේදිකා නාට්‍ය, අවගමනයකට ලක්වෙනු ඇතිය යන්න ඒ දිනවල නිතරම සාකච්ඡාවට බඳුන් වූ මාතෘකාවකි. රූපවාහිනියෙන් සිංහල චිත්‍රපටයක් පෙන්වන දිනවලට රූපවාහිනි යන්ත්‍ර ඇති ගම්බද නිවෙස් වලට විශාල වශයෙන් පිරිස් රැස්වූයේ ඒ සාකච්ඡා සාධාරණීකරණය කරමිනි. නමුත් පරිගනක භාවිතයෙන් රැකියා නැති වේ යැයි නැගුණු තර්ක අවලංගු කරමින් පරිගනක ආශ්‍රිත රැකියා විශාල ප්‍රමාණයක් බිහි වුනා සේම, චිත්‍රපට, නාට්‍ය කර්මාන්තයේ යෙදෙන්නන් ට හොඳ අවස්ථා ලබා දෙමින් ටෙලිනාට්‍ය යනාදී නව මාවත් රූපවාහිනිය ආශ්‍රයෙන් බිහිවිණි.

රූපවාහිනිය නැරඹීමට නැඹුරු වීමෙන් ළමා මානසික වර්ධනය සහ අධ්‍යාපනය ට අනිසි බලපෑම් ඇතිවෙයි ද යන්නද එකල සාකච්ඡා වුනු තවත් මාතෘකාවකි. එවකට උසස් පෙල මඩ ගොහොරුවේ එරී සිටි සිනුවර ආරච්චිල ට නම් එම මාතෘකාව අදල නොවීය. ඒ නැතිවුවත් ප්‍රධාන මාර්ගයෙන් ඔබ්බේ විදුලි බලය නොමැති නිවසක ජීවත් වූ අපට රූපවාහිනියෙන් කිසි කරදරයක් නොවිණි.කෙසේ වෙතත් දිනපතා රූපවාහිනිය නැරඹීමට ඉඩ ලද ළමුන් ඒ වෙත ඇදී ගිය බව නොරහසක් විය.

මේ කාලයේදීම ජාතික රූපවාහිනිය මගින්, රටේ ළමා පරම්පරාව තම සේවා කෙරෙහි රඳවා ගැනීමේ ප්‍රායෝගික අරමුණෙන් යුතුව මුතුහර නමින් ළමා සමාජ සංසදයක් ගම් මට්ටමින් විමධ්‍යගත කර ආරම්භ කරන ලදී. මේ ළමා සමාජ හරහා එක් රැස්වුණු දරුවන් ට ජාතික රූපවාහිනිය තුලින් තම කලා කුසලතාවයන් ඔප් නංවා ගැනීමට ද, පෞරුෂය ගොඩ නංවා ගැනීමට ද අවස්ථාව ලැබුණි.

අද ද සෑම ඉරිදාවකම සවස හයට මුතුහර ළමා වැඩසටහන විකාශය වෙන අතර 2010 වසරේ අප්‍රියෙල් මාසයේ දී මුතුහර ළමා සමාජය තම විසිපස් වෙනි සංවත්සරය සමරයි.

එදා අපෙන් ගිලිහී ගිය මුතුහර රූපවාහිනී ළමා සමාජයකට එක්වීමට අවස්ථාව, අද වසර විසි පහකට පමණ පසුව, ශ්‍රී ලංකාවෙන් දුරස්ථව සිටින අපේ දරුවන් ට ලැබී ඇත.ඕස්ට්‍රේලියාවේ ප්‍රථම මුතුහර රූපවාහිනී ළමා සමාජය සිඩ්නි නගරය ආශ්‍රිතව මින් මාස කිහිපයකට පෙර පිහිටුවා ගන්නා ලදුව පසුගිය සැප්තැම්බර් 19 වෙනිදා සිඩ්නි නගරයේ මැක්වයරි ආර්‍යා උද්‍යානයේ දී පැවැත්වුනු උත්කර්ෂවත් උත්සවයකින් එළි දක්වන ලදී. ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද ප්‍රථම මුතුහර ළමා සමාජය ලෙස මෙම සිඩ්නි මුතුහර ළමා සමාජය ඉතිහාස පොතට එක්වේ.

ඕස්ට්‍රේලියාව තුල මුතුහර ළමා සමාජයක් පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කළේ, තම "සොඳුරු සිහින" ගීතාවලිය සමග අප හමුවට ආ සිඩ්නි නුවර ගායිකා ශ්‍රියානි අබේනායක යි. ඇය ඕස්ට්‍රේලියාවේ මුතුහර සම්බන්ධීකරණ නිලධාරිණිය ලෙස ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙන් පත්වීම් ලබා ඇත.

අපේම කුඩා දරුවන් දෙදෙනෙකු විසින් වැයුණු මගුල් බෙර හඬ මධ්‍යයේ චාරිත්‍රාණුකූලව තෙල් පහන් දැන්වීමෙන් ඇරඹුණු මෙම උත්සව සභාව ඇමතුවන් අතර එවකට සිඩ්නි නුවර ශ්‍රී ලංකා කොන්සල් ගෝතමී ඉඳිකඩහේන සහ නිව් සවුත් වේල්සයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ එවකට සභාපති සාමප්‍රිය සුමනසේකර ද විය.

සිඩ්නි මුතුහර ළමා සමාජය සහ ඉහත උත්සවය අළලා සැකසුණු විශේෂ මුතුහර වැඩසටහන් දෙකක් ශ්‍රී ලංකාවේ රූපවාහිනී සංස්ථා චැනලය ඔස්සේ පසුගිය ද විකාශනය කරන ලදී.

සිංහල පාසැල් පවත්වාගෙන යෑමෙන් ද, සිංහල නැටුම් පන්ති සහ ඒ ආශ්‍රිතව නැටුම් සංදර්ශන පැවැත්වීමෙන් ද අපේ ඉදිරි පරම්පරා වලට සිංහල සංස්කෘතිය දායාද කරන්නට දෙමව්පියන් වශයෙන් අප දරන උත්සාහයට මුතුහර වැනි ළමා සමාජ තුලින් ඉමහත් පිටුවහලක් ලබා ගත හැකි බවට සැකයක් නැත.

ශ්‍රී ලංකාවේ මුතුහර ළමා සමාජය චිරාත්කාලයක් යෙහෙන් බැබැලේවා, සිඩ්නි මුතුහර ළමා සමාජය දියුණුවෙන් දියුණුවට පත්වේවා සහ ඒ සමගම මෙවැනි ළමා සමාජ රාශියක් ඕස්ට්‍රේලියාව පුරා බිහිවේවා යනුවෙන් ප්‍රාර්ථනා කරමින් අද සිනුවර හසුන අවසන් කරමි.

ඔබට සුභ නව වසරක් වේවා.

ලබන වසරේ නැවත හමුවෙමු.

සිනුවර ආරච්චිල

<sinuwara.arachchila@gmail.com>

MIGRATE TO AUSTRALIA
MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES
The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms

Meet our qualified consultants with years of experience who can deliver the results
Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986
Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.
Consultation by Appointment only
Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.
For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696